# වන අලි ඇතුන්ගෙන් සිදුවන හානි සඳහා ජීවනෝපායන් රක්ෂණය කිරීම (LIFE):

## ශ්‍රී ලංකාව සහ කෙන්යාව.

අලි මිනිස් ගැටුම් මගින් කුඩා පරිමාණ ගොවීන්ට සිදුවන හානි සඳහා පෞද්ගලික සමාගම් මගින් රක්ෂණ පහසුකම් සැපයීම.



iied

IPS

consultants

# ව්‍යාපෘතිය පිලිබඳ කෙටියෙන්

මෙම ව්‍යාපෘතිය මගින් අලි මිනිස් ගැටුම් හේතුවෙන් කාන්තා සහ පිරිමි, කුඩා පරිමාණ ගොවීන්ට සිදුවන හානි උදෙසා පෞද්ගලික සමාගම් මගින් රක්ෂණය කිරීමට ඇති ඉඩ කඩ පිළිබඳව විමර්ශනය කොට, එයට අදාල පහසුකම් සැපයීම අරමුණු කෙරේ.

ශ්‍රී ලංකාව සහ කෙන්යාව යන රටවල් දෙකෙහි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර දෙරටේම අලි මිනිස් ගැටුම් හේතුවෙන් ග්‍රාමීය ජීවනෝපායන් සහ ජෛව විවිධත්වය බරපතල තර්ජනයට ලක්ව ඇත. මෙයට අදාළ අවදානම පියවීම සඳහා පෞද්ගලික රක්ෂණ සමාගම් උනන්දුවක් පෙන්නුම් කර ඇත.

## ව්‍යාපෘතියේ කාලීන අවශ්‍යතාවය

වනජීවී-මිනිස් ගැටුම් ලෝකයේ බොහෝ ප්‍රදේශ වල වෙසෙන දුගී ගොවි ජනයා හට ජීවිත සහ ආර්ථික හානි පමුණුවයි. විශේෂයෙන්ම වනසංරක්ෂණ කලාප ආසන්නයේ වෙසෙන ගොවි ජනතාව නිරතුරුව මෙම හානි වලට ගොදුරුවීම සුලභ කරුණකි. බොහෝවිට, අප්‍රිකාවේ සහ ආසියාවේ සිදුවන වනජීවී-මිනිස් ගැටුම් සඳහා ප්‍රධාන මූලාශ්‍රය ලෙස අලිඇතුන් හඳුනාගෙන ඇත. වන අලිඇතුන් විසින් වගා හානි, භෝග ආහාරයට ගැනීම, දේපල හානි, ඇතැම්විට තුවාල සහ ජීවිත හානි ද සිදුකරයි. සෑම වසරකම කෙන්යාවේ මිනිස් ජීවිත 35 ක් සහ ශ්‍රී ලංකාවේ මිනිස් ජීවිත 80 ක් පමණ වන අලි ප්‍රහාර වලට ලක්ව අහිමිවෙයි.

මෙම තත්වය යටතේ, බොහෝ අවස්ථාවලදී, ප්‍රාදේශීය ජනතාව ස්වකීය ආරක්ෂාව සඳහා හෝ පළිගැනීමේ අදහසින් වන අලින් ජීවිතක්ෂයට පත් කිරීමට පෙළඹෙයි. ඒසේ නැතහොත් ඔවුන්, නීතිවිරෝධී දඩයම් කරුවන්ට තම සහය ලබා දීම සිදු කරයි. සෑම වසරකදීම කෙන්යාවේ වනජීවී බලධාරීන් විසින් ගැටලුකාරී වන අලින් 50 -120 අතර ප්‍රමාණයක් වෙඩි තබා ජීවිතක්ෂයට පත් කරයි. ශ්‍රී ලංකාවේ වාර්ෂිකව වන අලි ඇතුන් 230 ට අධික ප්‍රමාණයකට අලි මිනිස් ගැටුම් හේතුවෙන් ජීවිත අහිමි වෙයි. ශ්‍රී ලංකාවේ අලියා වඳවී යාමේ අවධානමට ලක්වූ සත්වයෙකු ලෙස නම් කර ඇති අතර පසුගිය වසර 60-75 තුලදී වන අලි ගහනය සියයට 50 ක අඩු වීමක් පිළිබිඹු කරයි. දැනට ශ්‍රී ලංකාවේ වනාන්තර වල සිටින අලින් සංඛ්‍යාව 2500-4000 ක් පමණ වන බව වාර්තා වේ.

ගෝලීය වශයෙන්, වනජීවී-මිනිස් ගැටුම් අවම කිරීම සඳහා විවිධ භෞතික සහ මූල්‍යමය මැදිහත්වීම් සිදු කර ඇතත් එම උත්සහයන් සීමිත සාර්ථකත්වයක් පෙන්නුම් කරයි. සීමිත අවස්ථා ගණනකදී පුද්ගලික රක්ෂණ විකල්ප උපාය මාර්ගයක් ලෙස භාවිතා කර ඇති නමුත් මේ දක්වා වාණිජ රක්ෂණ සමාගම් සම්බන්ධ කර ගැනීමට උත්සහයක් දරා ඇත්තේ අවම මට්ටමකිනි. මෙම ව්‍යාපෘතිය මගින්, ශ්‍රී ලංකාව සහ කෙන්යාව ආශ්‍රිතව එවැනි රක්ෂණ ක්‍රමයක් සඳහා ඇති ශක්‍යතාව පිළිබඳව අධ්‍යයනය ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු ලෙස නියමු අධ්‍යයනයක් මගින් නව රක්ෂණ යෝජනා ක්‍රම ස්ථාපනය සඳහා දෙරටේ රජයන් හට ආධාර කිරීම, අධ්‍යයනයේ දැනුම හුවමාරු කරගැනීම සහ කාර්යක්ෂම ජාතික ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම සඳහන් කල හැක.

මෙම පර්යේෂණය අලි මිනිස් ගැටුම උදෙසා රක්ෂණාවරණ සැපයීමේදී මුහුණපාන ප්‍රධාන අභියෝග හතරක් කෙරෙහි අවධානය යොමු කරනු ඇත:

- පිරිවැය ඵලදායී ලෙස හානිය තහවුරු කර ගැනීම
- කාලෝචිත හා සාධාරණ ගෙවීම්
- ගැටුම් උත්සන්න කරන හානිකර පෙළඹවීම් වළක්වා ගැනීම උදෙසා ගෙවීම් නිවැරදිව යොමු කිරීම
- වාරික ගෙවන්නේ කවුරුන් විසින්ද යන කරුණට අදාලව වූ මූල්‍ය තිරසාරභාවය තහවුරු කිරීම

මෙම පර්යේෂණය මගින් අලි මිනිස් ගැටුමෙන් පීඩාවට පත් ජනතාව සිටින අනෙකුත් රටවලද මීට සමාන යෝජනා ක්‍රම ඇති කිරීමට අවශ්‍ය දැනුම ජනනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## අපගේ අභිලාෂයන්

අලි ඇතුන්ගේ වාසස්ථාන සහ සංක්‍රමණික මාර්ග කරා මානව ක්‍රියාකාරකම් ව්‍යාප්ත වීමේ සෘජු ප්‍රතිඵලයක් ලෙස ක්‍රමයෙන් උත්සන්න වන අලි මිනිස් ගැටුම අවම කිරීමට මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය අවසන් වන විට දෙරටේ ව්‍යාපෘතියට සහභාගී වූ රක්ෂණ ක්‍රමයෙන් ආවරණය වන පිරිමි සහ ගැහැණු ගොවීන් සඳහා අලි මිනිස් ගැටුම හේතුවෙන් සිදුවන පාඩු හා හානි අවම වශයෙන් 20% කින් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද පෞද්ගලික රක්ෂණයක් හඳුන්වාදීම මගින් අලි මිනිස් ගැටුමෙන් ශ්‍රී ලංකාවේ හා කෙන්යාවේ අලි මරණ 10% කින් පමණ අඩු කිරීමට හැකිවනු ඇතැයි බලාපොරොත්තුවේ.

## ක්‍රියාකාරකම් වල කාල නියමය

### පළමු වසර

| |
|---|
| කෙන්යාවේ සහ ශ්‍රී ලංකාවේ ආරම්භක රැස්වීම් |
| කෙන්යාවේ සහ ශ්‍රී ලංකාවේ අලි මරණ හා ගොවීන්ට සිදුවන හානි හා අලාභ පිළිබඳ මූලික තොරතුරු ජනනය කිරීම සඳහා සමීක්ෂණ / දත්ත විශ්ලේෂණය |
| IIED සමාලෝචන සමඟ AB උපදේශක ආයතනය (කෙන්යාව) සහ IPS (ශ්‍රී ලංකාව) විසින් රක්ෂණ ක්‍රමයක් සැලසුම් කිරීම |
| වනජීවී-මිනිස් ගැටුම් සඳහා වන රක්ෂණ සහ වන්දි යෝජනා ක්‍රමවල පවත්නා අත්දැකීම් පිළිබඳ පර්යේෂණ තොරතුරු සමාලෝචනය |

### දෙවන වසර

| |
|---|
| කෙන්යාවේ සහ ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්‍රමයක් සැලසුම් කිරීම |
| කෙන්යාවේ සහ ශ්‍රී ලංකාවේ ජාතික සංවාද පැවැත්වීම |
| කෙන්යාවේ සහ ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම |

### තෙවන වසර

| |
|---|
| ගෘහස්ත සමීක්ෂණ සහ කෙන්යාවේ සහ ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම් සමඟ සම්මුඛ සාකච්ඡා තුළින් රක්ෂණ ක්‍රම හඳුනාගැනීම, ක්‍රියාත්මක කිරීම සහ ඵලදායීතාවය අධීක්ෂණය කිරීම |
| කෙන්යාවේ සහ ශ්‍රී ලංකාවේ හවුල්කරුවන් විසින් ලබාගත් අත්දැකීම්, දැනුම සහ නිර්දේශයන් ලේඛනගත කිරීම |
| ජාතික සංවාදය |
| මෙම යෝජනා ක්‍රමය ජාතික මට්ටමෙන් හා රක්ෂණ සමාගම් විසින් ක්‍රියාත්මක කරවීම සඳහා රජයේ කැපවීම තහවුරු කර ගැනීම |
| ජාතික වාර්තාව පදනම් කරගෙන දෙරටෙන් ලබා ගන්නා ලද අත්දැකීම් වල සංසන්දනාත්මක විශ්ලේෂණය (සංශ්ලේෂණය) |
| අවසාන ජාත්‍යන්තර වැඩමුළුව |
| තොරතුරු ව්‍යාප්තිය හා දුරස්ථ ක්‍රියාකාරකම් |





# ප්‍රතිදානයන් සහ ප්‍රතිඵල

| ප්‍රතිදානයන් | ප්‍රතිඵල |
|---|---|
| 2013 වනජීවී, වනජීවී සංරක්ෂණ හා කළමනාකරණ පනත මත පදනම්ව කෙන්යාවේ මානව-වනජීවී ගැටුම් රක්ෂණය කිරීමේ ජාතික යෝජනා ක්‍රමයකට තාක්ෂණික සහාය ලබා දීම. | ව්‍යාපෘතිය අවසානයේදී කෙන්යාවේ පුද්ගලික රක්ෂණ සමාගම් විසින් ගැහැණු සහ පිරිමි ගොවීන් සඳහා නිර්මාණය කරන ලද මානව-වනජීවී ගැටුම් රක්ෂණය සඳහා වූ ජාතික යෝජනා ක්‍රමයක් පැවතීම |
| ශ්‍රී ලංකාවේ මානව-වනජීවී ගැටුම් සඳහා නියමු රක්ෂණ ක්‍රම සඳහා තාක්ෂණික සහාය ලබා දීම | ශ්‍රී ලංකාවේ, තෝරාගත් ස්ථානවල කාන්තා හා පිරිමි ගොවීන් සඳහා පෞද්ගලික රක්‍ෂණ සමාගම් සමඟ එකාබද්ධව ජාතික රක්‍ෂණ යෝජනා ක්‍රම සැලසුම් කර තිබීම |
| මානව-වනජීවී ගැටුම් විසඳීමේදී පුද්ගලික රක්ෂණ ක්‍රමවල කාර්යභාරය පිළිබඳ ගෝලීය යහභාවිතයන් (good practices) සාකච්ඡා කිරීම | මානව-වනජීවී ගැටුම් අවම කිරීම සඳහා පුද්ගලික රක්ෂණයේ කාර්යභාරය පිළිබඳව ගෝලීය යහභාවිතය පිළිබඳ එකඟත්වයකට පැමිණීම |



# අපි කවුද?

## පරිසර හා සංවර්ධන ජාත්‍යන්තර ආයතනය (IIED)

IIED විසින් සමස්ත තාක්ෂණික අධීක්ෂණය, ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කිරීම, හවුල්කරුවන් සමග ගිවිසුම්ගත වීම සහ පර්යේෂණ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම සහ මුල්‍ය දායකයන්ට වාර්තා කිරීම සිදුකරනු ඇත. IIED තාක්ෂණික අධීක්ෂණය මත ව්‍යාපෘතිය ආරම්භයේ දී දැනට ගෝලීයව පවත්නා රක්ෂණ යෝජනා ක්‍රම පිළිබඳව සහ ව්‍යාපෘතිය අවසානයේ දී දෙරටෙන් උගත් පාඩම් සමාලෝචනය කිරීම සිදු කෙරේ. තවද කෙන්යාවේ සහ ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ ආයතන, ගෝලීය විශේෂඥයන් හා වෘත්තිකයන් සමඟ සම්බන්ධ කිරීම ද සිදු කරයි.

IIED යනු ප්‍රතිපත්ති අධ්‍යන හා පර්යේෂණ සංවිධානයකි. එමගින් ජීවනෝපායන් වැඩිදියුණු කිරීම සහ එම ජීවනෝපායන් ආශ්‍රිත පරිසරය ආරක්ෂා කිරීම සඳහා තිරසාර සංවර්ධන මාර්ගයන් ප්‍රවර්ධනය කරනු ලැබේ. තවද දේශීය ප්‍රමුඛතා ගෝලීය අභියෝග සමඟ සම්බන්ධ කිරීම පිළිබඳව විශේෂඥතාවක් සහිත ආයතනයකි. IIED ලන්ඩනයේ පිහිටා ඇති අතර අප්‍රිකාව, ආසියාව, ලතින් ඇමරිකාව, මැද පෙරදිග සහ පැසිෆික් කලාපයේ ක්‍රියාත්මක වෙමින් ලෝකයේ වඩාත්ම අවදානමට ලක්විය හැකි ජන ප්‍රජාවන් සමඟ කටයුතු කරයි.

## AB උපදේශක සමාගම, කෙන්යාව

කෙන්යාවේ රක්ෂණ යෝජනා ක්‍රමය සැලසුම් කිරීම සඳහා AB උපදේශක සමාගම නායකත්වය දෙනු ලබයි.

AB උපදේශක සමාගම යනු කෙන්යාව සහ උප සහරා අප්‍රිකාවේ සෙසු ප්‍රදේශවලට රක්ෂණය ප්‍රචලිත කිරීමට උත්සාහ කරන ස්වාධීන ආයතනයකි.

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (IPS)

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ක්ෂේත්‍ර කටයුතු මෙහෙයවනු ඇත. 1988 දෙසැම්බරයේ පාර්ලිමේන්තු පනතක් මගින් පිහිටුවන ලද අතර 1990 අප්‍රියෙල් මාසයේදී නිල වශයෙන් නීතිමය ආයතනයක් ලෙස පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රටේ ප්‍රමුඛතම ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය ලෙස ස්ථාපිත වී ඇත. IPS ආයතනය එහි පර්යේෂණ වල ස්වාධීනත්වය සහ විශිෂ්ටත්වය සම්බන්ධයෙන් දකුණු ආසියානු කලාපයේ පිළිගැනීමක් ලබා ඇත. පාරිසරික හා ස්වාභාවික සම්පත් කළමනාකරණය සහ දේශගුණික විපර්යාස පිළිබඳ ප්‍රතිපත්තිමය පර්යේෂණ, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රමුඛතා අතරවේ. ගෝලීය සංවර්ධන ජාලයේ (GDN) අරමුදල් ආධාරයෙන් ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ගොවීන් සඳහා දේශගුණික රක්ෂණ ක්‍රමයක් තක්සේරු කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් අධ්‍යයනයක් සිදු කරන ලද අතර වනජීවී- මානව ගැටුම සඳහා රක්ෂණයේ අවශ්‍යතාව පිළිබඳ නිරීක්ෂණ ගණනාවක් ද මෙයට ඇතුළත් විය.

## ඔබත් සම්බන්ධ වන්න

අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න

ව්‍යාපෘති තොරතුරු අන්තර්ජාලය මගින් ලබා ගත හැකි අතර ඒ සඳහා පිවිසුම පහත පරිදි වේ.
https://www.iied.org/livelihoods-insurance-elephants-life-kenya-sri-lanka

නිරතුරුව සම්බන්ධ වන්න

**පරිසර හා සංවර්ධන ජාත්‍යන්තර ආයතනය (IIED) -** පෝල් ස්ටීල්

paul.steele@iied.org

**IIED -** ඩිලිස් රෝ dilys.roe@iied.org

**IPS -** අතුල සේනාරත්න athula@ips.lk

**AB Consultants -** බාබරා චබ්බාගා
barbara.chabbaga@abconsultants.co.ke

**ව්‍යාපෘති විෂයන්**
ආර්ථික විද්‍යාව; ජෛව විවිධත්වය

මූල පද:
වනජීවී, කුඩා පරිමාණ ගොවිතැන, ජීවනෝපායන්

**අපේ අරමුදල්කරුවන් ගැන යමක්**

අරමුදල් සපයන්නේ එක්සත් රාජධානියේ **Darwin Initiative** විසිනි

**Darwin Initiative** යනු එක්සත් රාජධානියේ රජය මගින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘති හා මූල්‍ය ප්‍රදාන යෝජනා ක්‍රමයක් වන අතර එය ලොව පුරා දේශීයව පදනම් වූ ව්‍යාපෘති හරහා ජෛව විවිධත්වය සහ ස්වාභාවික පරිසරය ආරක්ෂා කිරීමට උපකාරී වේ. ජෛව විවිධත්වයෙන් පොහොසත් නමුත් මූල්‍ය සම්පත් නොමැති දුප්පත් රටවලට ජෛව විවිධත්ව සම්මුතීන් එකක් හෝ වැඩි ගණනක් යටතේ ඔවුන්ගේ අරමුණු ඉටු කර ගැනීමට උපකාර වන ව්‍යාපෘති සඳහා අරමුදල් සපයයි.

## ඡායාරූප

Front cover: Photo by Larry Li on Unsplash

Page 2: Photo by Bread for the World from Flickr via creative commons/ Photo by Dhammika Heenpella from Flickr via creative commons

Page 4: Photo by Sutirta Budiman on Unsplash

Funded by The Darwin Initiative

DARWIN INITIATIVE